# ගෙදර පොකුණක මසුන් ඇතිකරන්න

පොකුණුවල මසුන් ඇති කිරීම අග්නිදිග ආසියාතික රටවල මෙන් ම බටහිර රටවලද ඉතා ජනප්‍රිය ය. ශ්‍රී ලංකා ජනතාවගේ එදිනෙද ආහාරයේ මාංශජනක ධාතූන් (ප්‍රොටීන්) හිඟය. එම මාංශජනක ධාතු හිඟය මඟහරවා ගැනීමට පොකුණුවල මසුන් ඇති කිරීම ප්‍රයෝජන වත්ය. එමෙන්ම දිනෙන් දින උග්‍රවන ආහාර ප්‍රශ්නය නිරාකරණය කිරීමටද එය මාර්ග යක් වනු ඇත.

## 1. සුදුසු බිම් තෝරා ගැනීම

බොරළු වැලි හෝ මැටි සහිත පතුල් ද දිරා ගිය ගස් මුල් ඇති අම්ල සහිත ප්‍රදේශ ද පොකුණකට සුදුසු නැත. කෙසේ වුව ද පොකුණ පතුලට අළුහුණු යෙදීමෙන් එහි තත්වය දියුණු කළ හැකි ය. සත්ව හා වෘක්ෂ දිරාපත් වූ (හියුමස්) කළු පැහැති පස් ඇති ප්‍රදේශ මාළු ඇති කිරීම සඳහා ඉතාමත් යෝග්‍යයි.


## 2. පොකුණු පිළියෙළ කිරීම

අක්කරයකින් 1/16 ක් ප්‍රමාණයේ (40'x70') කුඩා පොකුණක් හෝ පොකුණු කීපයක් සකස් කර ගැනීම සුදුසුය. පොකුණෙහි අඩි 3 ක් පමණ ගැඹුරුව සිටින සේ ජලය පිර විය යුතු යි. එහෙත් එහි ඉවුරුවල තණ කොළ පිඩලි නො එසේ නම් කංකුන්, මුකුණුවැන්න වැනි ජලාශ්‍රිතව වැඩෙන පැලෑටි වැවිය යුතු ය.

## 3. සුදුසු මසුන් වර්ග

දැනට ධීවර දෙපාර්තමේන්තුව විසින් එහි මසුන් බෝ කරන ස්ථාන වල වර්ග හතරක මාළු පැටවුන් (අඟල් 2–3 දක්වා දිග) බෝ කරනු ලැබේ. උන ගේ නම් මෙසේය. තිලාපියා මොසැම්බියා, තිලාපියා මෙනලොප් ලියුරා, සාමාන්‍ය කාපයා සහ යෝධ ගුරා


මැතදී බෝකල විදේශීය මසුන්




තිලාපියා මොසැම්බිකා



තිලාපියා මෙලනොප්ලියුරා



සාමාන්‍ය කාපයා



යෝධ ගුරාමියා

මියා ය. මේ මාළු පැටවුන් නොමිලයේ ධීවර දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකිය. තිලාපි වර්ග දෙක සහ ගුරාමි සුදුසු වන්නේ මුහුදු මට්ටමේ සිට අඩි 3,000 දක්වා ප්‍රදේශ යන්හි පොකුණුවල ඇති කිරීම සඳහා ය. සාමාන්‍ය කාපයා මුහුදු මට්ටමේ සිට අඩි 5,000 දක්වා උස් ප්‍රදේශවලට සුදුසු ය. අඩි 5000 ට වැඩි උස් වූ ප්‍රදේශවල පොකු ණුවල ඇතිකිරීම සඳහා ඉතාමත් සුදුසු මසුන් වර්ගය නම් ට්‍රවුට් මසුන්ය. ට්‍රවුට් මාළු පැටවුන් නුවරඑළියේ ධීවර මධ්‍යස්ථාන යෙහි මසුන් බෝ කරන ස්ථානයෙන්ලබා ගැනීමට පුළුවන.

ආහාර හා වෙනත් කරුණු අනුව මේ මසුන් වර්ග කොටස් තුනකට බෙදිය හැකි ය.

(අ) තණකොළ හා ජලයේ වැවෙන හයි-ඩ්‍රිල්ලා, ඔක්වීඩ් යනාදී පැලෑටිවල කොළ බෙහෙවින් කන දිය මතු පිට ආහාර ගන්නා මසුන් (තිලාපියා මෙල නොප්ලියුරා හා යෝධ ගුරාමි.)

(ආ) දිය පැලෑටි හා සත්ව ප්‍රාණීන් කන මැද ජලයේ ආහාර ගනනා තිලාපියා මොසැම්බිකා.

(ඇ) පිළවුන්, පණුවන්, කුඩා ගොලුබෙල් ලන් හා පොකුණු පතුලෙ දිරාගිය කුණු ද්‍රව්‍ය ආහාරයට ගන්නා සාමාන්‍ය කාපයා.

මේ වර්ගවල මසුන් එකවිට එකම පොකු නේ ඇති කළ හැකිය. පොකුණු තුළ ස්වා භාවිකව සැදෙන ආහාර සඳහා උන් අතර තරඟයක් ඇති නොවේ.

අක්කර 1/16 ක ප්‍රමාණයේ පොකුණකට දැමිය යුතු සාමාන්‍ය කාප පැටවුන් සංඛ්‍යාව 300 ක් පමණ වේ. දෙතුන් වර්ගයක මසුන් එකට ඇති කරන්නේ නම් කාප පැටවුන් 150 ක් ද, තිලාපි පැටවුන් 100 ක් ද, යෝධ ගුරාමි පැටවුන් 50 ක් ද එක පොකුණක ඇති කිරීම සුදුසු වේ.

## 4. කෑම දීම හා රැකබලා ගැනීම

මාළු පැටවුන් පොකුණට දැමීමෙන් අනතුරුව උන් වැඩුන පසු අල්ලා ගැනීමේ කාලය තෙක් උන්ට කෑම දිය යුතු ය. මේ සඳහා පොල් පුන්නක්කු සහ හාල් නිවුඩු හෝ කුකුල් කෑම 4:1 සේ මිශ්‍රණයක් සකස් කර ගත යුතුය.

දිනකට දැමිය යුතු කෑම ප්‍රමාණය
රාත්තල්

| | | | |
|---|---|---|---|
| 1 වැනි මාසයේ දී | ... | ... | 1/4 යි. |
| 2 වැනි මාසයේ දී | ... | ... | 1/2 යි. |
| 3 වැනි මාසයේ දී | ... | ... | 3/4 යි. |
| 4 වැනි මාසයේ දී | ... | ... | 1 යි |
| 5 වැනි මාසයේ දී | ... | ... | 1 1/2යි. |
| 6 වැනි මාසයේ දී | ... | ... | 1 1/2 යි. |
| 7 වැනි මාසයේ දී | ... | ... | 2 යි. |

පොකුණෙහි තිලාපියා මෙලනොප්ලියුරා සහ ගුරාමි පැටවුන් ඇති කරන්නේ නම්, ඉහත දක්වා ඇති කෑම වලට අමතරව කන්කුන් හෝ එවැනි දිය පැලෑටි වර්ගයක් පොකුණට දැමිය යුතුය. ලබා ගත හැකි නම් පරණ පාන සහ කුස්සියෙන් ඉවත දමන ආහාර ද්‍රව්‍ය ද උන් ගේ කෑමට පොකුණට දැමිය යුතු ය.

## 5. මසුන් අල්ලා ගැනීම

නිසි පරිදි හා අවශ්‍ය තරම් කෑම දෙමින් ඇති කළ මසුන් මාස 7 ක් ගතවූ පසුව ආහාරයට ගැනීමට සුදුසු තරම් (එකෙකු ගේ බර රාත්තල් 3/4 ක) ප්‍රමාණයකට වැඩෙන ඇත. මේ කාලයේ දී පොකුනේ මාළු රාත්තල් 200 ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත හැකි වේ.

(ධීවර දෙපාර්තමේන්තුවේ පත්‍රිකාවක් ඇසුරිනි)